**නාමල්ඔය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූලි 13 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. සමාලෝචිත වර්ෂයේ මිළදීගෙන තිබුණු රු.85,490 ක ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සභාව සතු වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගනිමි.<br>2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| ii. සමාලෝචිත වර්ෂයේ අතිකාල හා ගමන් වියදම් වෙනුවෙන් දරන ලද රු.37,952 ක් සඳහා ගිණුම්වල පොදු සැපයුම් ණය හිමියන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි.<br>2020 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| iii. 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ මත ඉවත්කරන ලද ලී බඩු සවිකිරීම් හා යන්ත්‍රෝපකරණවල වටිනාකම රු.115,128 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි.<br>ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| iv. සමාලෝචිත වර්ෂයේ ඉටුකරන ලද සංවර්ධන ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.9,882,628 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි.<br>2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| v. 2018 හා 2019 වර්ෂවල ඉටුකරන ලද සංවර්ධන ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් ලැබිය යුතු රු.10,418,560 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| vi. 2014 සිට 2018 දක්වා වර්ෂවලට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු රු.40,400 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. |
| vii. සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගනිමි. |
| viii. සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.588,953 ක කොම්පෝස්ට් හලරය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. |

**(ආ) නොසැසඳූ ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් විෂයයන් 5 ක වටිනාකම් සහ ඊට අදාල පොත්පත් හා ලේඛනවල වටිනාකම් අතර රු.84,922,645 ක වෙනස්කම් විය. | අදාල ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නොසැසඳූ ගිණුම් පිළිගනිමි. 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.180,551,018 ක වත්කම් විෂයන් 05 ක් හා රු.1,318,836 ක වගකීම් විෂයන් 03 ක් සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශ වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | දැනටමත් ලේඛන යාවත්කාලීන කර ගෙන යන බැවින් ඉදිරියේදී මෙවැනි අඩු පාඩු සිදු නොවීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය | සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු වාර්තා පනවා අදාල වියදම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සකස් කර පළාත් සභාවේ හා ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය සඳහා යවා ඇතත් මෙතෙක් ඒවා අනුමත කර නොමැත. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 | සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ඉඩම් පවරාගෙන තක්සේරු වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති මාලාව අනුව කටයුතු කළ යුතු වේ. | ඉඩම් පවරා ගැනීමෙන් පසු තක්සේරු කිරීමේ කටයුතු සිදුකර ගැනීමටත් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ - | | | |
| | (i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ආයතනයේ මුදල් ප්‍රතිපාදන මත ඉදිරියේදී මිලදී ගැනීමට කටයුතු යොදා ඇත. |
| | (ii)2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 07 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ඉන්ධන දහන පරීක්ෂා කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | 2015 ඔක්තොම්බර් 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ගර්භිත තත්ත්වයේ පැවැති වාහන 04 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම වාහනය අපහරණය කිරීම ප්‍රමාද වී ඇත්තේ වාහන වල අයිතිය සභාවට පවරා ගැනිම ප්‍රමාද වූ නිසා බව ප්‍රකාශ කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,595,526 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.612,895 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බැංකු ගිණුම් 03 කට අදාලව වර්ෂ ගණනාවක සිට පැවත එන ආදායමට ගත් නමුත් බැංකු ගත නොවූ රු.29,335 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | සභාවේ ආදායමට ගත් නමුත් බැංකු ගත නොවූ වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම මුදල් බැංකු ගිණුම් වලින් ඉවත් කිරීමට පළාත් පාලන කොමසාරිස් තුමා හරහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමුකර ඇති බවත් අනුමැතිය ලැබුණු පසු ඒවා ඉවත් කිරීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| වරිපනම් හා බදු | 304,500 | 84,500 | 84,500 | -- | 270,000 | 66,000 | 66,000 | -- |
| කුලී | 2,408,600 | 1,967,487 | 1,959,918 | 30,608 | 2,438,600 | 2336,012 | 2,353,833 | 23,039 |
| බලපත්‍ර ගාස්තු | 422,000 | 525080 | 525,080 | 22,505 | 372,000 | 712,590 | 712,590 | 22,505 |
| වෙනත් ආදායම් | 2,121,000 | 2,861,805 | 3,058,074 | 217,698 | 2,013,006 | 2644,399 | 2,552,486 | 413,967 |
| | **5,256,100** | **5,438,872** | **5,627,572** | **270,811** | **5,093,606** | **5,759,001** | **5,684,909** | **459,511** |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | ප්‍රධාන කාරනා 5ක් සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කර පළාත් සභාවට යොමුකර ඇතත් මේවන තෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බැකෝ යන්ත්‍රයේ ඉදිරිපස වීදුරුවට සිදු වූ හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | දෛනික වැටුප් මත බඳවා ගත් රියදුරකු අතින් මෙම අලාභය සිදු වී ඇති නිසා අයකර ගැනීම සම්බන්ධ ගැටලුව ඇති වී ඇති බැවින් ඉදිරියේදි මොහු ලවා මෙය අලූත් වැඩියා කර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්තය | | |
| i. 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 04 ක 05 ක් විය. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගත යුතු වේ. | පුරප්පාඩු පිරවීම සම්බන්ධ කටයුතු පළාත් පාලන කොමසාරිස් හරහා සිදු කරන බව දන්වමි. |

| | | |
|---|---|---|
| ii. විශ්‍රාම ගිය හා ස්ථාන මාරු ලැබූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය නොවී පවතින සේවක ණය රු.39,388 ක් විය. | අයනොවී පවතින සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මින් එක් නිලධාරියෙකු දැනට විශ්‍රාම ගොස් ඇති බවත් ඉදිරියේදි මෙම ගැටළුව නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බව දන්වමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය හා පළාත් සභාවෙන් 1993 හා 2005 වර්ෂ වලදී ප්‍රාදේශීය සභාවට ලැබුණු වාහන හා යන්ත්‍රෝපකරණ 04 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | වාහන වල අයිතිය පවරා ගැනීමට කටයුත කළ යුතු වේ. | ඉදිරියේ දී මේ සඳහා කටයුතු කරන බව දන්වමි. |

**3.4.2 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාහන හා යන්ත්‍රෝපකරණ 08 ක් වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා නොගෙන 2019 ධාවනයේ යොදවා තිබුණි. | සභාව සතු සියලු වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව ප්‍රකාශ කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | එක් එක් වර්ෂ සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | පසුගිය වර්ෂයේදී විගණනයෙන් පෙන්වා දුන් පසු 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැසීමක් පිළියෙල කර සභාවේ අනුමත කර ගත් බව දන්වමි. |

**3.5.2 සැපයීම් හා සේවා**

**--------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **----------------------** | **----------** | **--------------------------------** |
| සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා ශබ්ද විකාශන පද්ධතියක් මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මිලදී ගැනීම් සිදුකර, පසුව ව්‍යාජ ලේඛන ලිපිගොනු වලට ඇතුලත් කර තිබුණි. | රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතු වේ. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගන්නා බවට දන්වමි. |